

## ගෙවතු වගාවට උපදෙස්

# 1. පස ආරක්ෂක ක්‍රියා

නගරබද ගෙවල්වලට අයත් ගෙවතු ප්‍රමාණය බොහෝවිට සුළු ඉඩම් කැබෙල්ලක් පමණි. එහෙත් ග්‍රාමීය පෙදෙස්වල ගෙවතු මීට වඩා විශාල වෙති. අක්කර බාගයක් හෝ ඊට යාබද ප්‍රමාණයක් ඇති අවස්ථා එමටය. එමෙන්ම නගරබද කුඩා ගෙවතුවල පිහිටීම වැඩි වශයෙන් තැනිතලා වෙති. ග්‍රාමීය ගෙවතු බොහෝ අවස්ථාවල පිහිටා ඇත්තේ බෑවුම් සහිත ඉඩම්වල හෙයින් යම් ප්‍රමාණයක හෝ පස සංරක්ෂණ ක්‍රියා මාර්ගයක් වුවමනා බව අපට පෙනී ඇත. පස ආරක්ෂක වැඩ යෙදිය යුතු නගරබද ගෙවතු පවා අඩුවක් නැත. එනිසා ගෙවතු වගාව ගැන උපදෙස් මාලාවක් සපයන මෙම තීරයේ ගෙවතුවලට පස සංරක්ෂණ ක්‍රියා යොදන මාර්ගය පෙන්වන විස්තරයක් අතිශයින් ප්‍රයෝජනවත් බව නිසැකය.

ගේ හිමියා තම ගෙවත්තේ මල්, පළතුරු, එළවලු, ආවරණ පැළෑටි ආදී නොයෙක් දේ පහසුවෙන් හා සීඝ්‍රයෙන් වවා ගැනීමට අදහස් කරන හෙයින් ගෙවත්තේ පස සශ්‍රීකව රඳවා ගැනීමට ඔහු වෙහෙස විය යුතුය. කුඩා ඉඩම් ප්‍රමාණයක නිවාසයක් ඉදි කිරීමට විධි විධාන යොදන විට ඉඩමේ මතු පස එහා මෙහා වී එහි ස්වරූපය වෙනස් වෙයි. එසේ හෙයින් ගෙවත්තේ මතු පස හැකි තරම් වේගයෙන් දියුණු කර ගැනීම ප්‍රයෝජනවත් ක්‍රියාවකි. එවැනි ගෙවත්ත බෝග වගාවට හුරු කරවා ගැනීමේ ප්‍රථම පියවර පස සංරක්ෂණ ක්‍රියා යෙදීම වෙයි. පස මහඟු ස්වාභාවික සම්පතක් නිසා එය රැකබලා ගැනීමේ ආරම්භය, පළමුව අපට යෙදීමට පුළුවන් කුඩාවටය. එමනිසා දිවයිනේ පස සංරක්ෂණ ක්‍රියා ඇරඹීමට සුදුසු ස්ථානය අපේ ගෙවත්ත වෙයි .

මතු පස මෙහෙයවා තමාට වුවමනා ආහාර පානාදිය සපයන පැළෑටිමෙන්, අලංකාර පැළෑටිද ඉතා සාර්ථකව වගා කළ හැකි බව

අපි දනිමු. එම මතු පස සංරක්ෂණ කරගත හැකි මාර්ගය මෙහි විස්තර කිරීම එනිසා කාලෝචිත වෙයි. ගෙවත්තට යෝග්‍ය පස ආරක්ෂක මාර්ගවලින් පළමුවැන්න "කොන්ටුවර්" වේලි හෝ වැටි දැමීමය. ඉඩමේ බෑවුම අනුව පරතරයක් යොදා ඉදි කරන කොන්ටුවර් වේලි සාමාන්‍ය පසක් ඇති ඕනෑම භූමියකට නිර්දේශිතය. කොන්ටුවර් වේලි දමා පස සුරක්ෂිතව ආරක්ෂා කරගත නොහැකි පරිදි බෑවුමක් ඇති ගෙවත්තට ලියදි ක්‍රමයක් යෙදීම යෝග්‍ය බව පෙනේ. ගෙවත්තට කොන්ටුවර් වේලි හෝ ලියදි භාවිතා කළ යුතු දැයි තීරණය වන්නේ ඉඩමේ පිහිටීම අනුව වෙයි. බෑවුමෙන් වැඩි, ගල් සහිත ඉඩම්වල ගල්වැටි දමා ගැනීම ඉතා හොඳ පස සංරක්ෂණ ක්‍රමයක් බව පෙනී ඇත. ගෙවත්තේ පොල් පැළ, සෙවන ගස්, පළතුරු ආදිය වගා කළ විට එම ස්ථිර බෝගවලට පෞද්ගලික තැනිතලාවන් කපා ගැනීමෙන් ප්‍රයෝජනවත්ව මතු පස ආරක්ෂා කර ගත හැකි වේ. මෙවැනි තැනිතලා අගට ගල් ඇල්ලීමද සමහරවිට උද්‍යෝගිමත් ගොවීන් කර තිබෙනවා අපට දක්නට ලැබී ඇත. මෙවැනි පෞද්ගලික ලියදි බෑවුම හරහට පහත් වන සේ නිර්මානය විය යුතුය.

කොන්ටුවර් ලකුණු කිරීම සඳහා සිරිත් වශයෙන් යොදන උපකරණය මිළ අධික හෙයින්, ගෙවත්තේ පස සංරක්ෂණ ක්‍රියා යෙදීමට මීගමුවේ බේරන් මහතා විසින් සකස් කරණ ලද මිළ පහසු කොන්ටුවර් ලකුණු කරණය සාර්ථකව යෙදීමට පිළිවන. (මෙම උපකරණය ගැන විස්තර සඳහා ගොවිකම් සඟරාවේ 3 වන කාණ්ඩයේ 1වන කලාපයේ 306 වන පිටුව බලන්න.)

ගෙවත්තට ලැබෙන වර්ෂා ජලය ඉඩමේ පහළට ගලා බසින්න නොහැර නොයෙක් පස ආරක්ෂක අවහිර ක්‍රමයන් යෙදීමෙන් පමණක් මතු පස සුරක්ෂිතව ගෙවත්තේම තබා ගත නොහැකිය. ගෙවත්තට ලැබෙන වැසි ජලය වඩා සාර්ථකව ඉඩමට උරා ගැනීම සඳහා විධිවිධාන යෙදීම අතපසු නොකළ යුතු ප්‍රායෝගික කාර්යයෝ වෙති. ගොම, කොළ හා මිශ්‍ර පෝර වැනි ඓන්ද්‍රිය ද්‍රව්‍ය පසට අඩංගු කිරීමෙන් එහි ජලය උරා ගැනීමේ හැකියාව වැඩි වෙයි. මෙසේ කිරීමෙන් පස ආරක්ෂක වේලි, ගල් වැටි ආදියේ ප්‍රයෝජනත්වයද නගා සිටුවේ.

## 2. පැළ ඉති වැටවල්

ගෙවත්ත ගවයන් ආදී සතුන්ගෙන් පමණක් නොව, සොර සතුරන්ගෙන් පවා සුරක්ෂිතව තබා ගැනීමට ඒ වටා වැටක් තිබීම අත්‍යාවශ්‍යය. බොහෝ නාගරික ගෙවතුවටේ බැඳි තාප්ප ඇති අතර සමහර පිටිසර ගෙවතු වටද එවැනි ස්ථිර ආරක්ෂක මාර්ග යොදා තිබේ. බොහෝ ග්‍රාමීය ජනතාවට පමණක් නොව නාගරික වැසියෝ සැලකිය යුතු ගණනාවකටද මුදල් විශාල ප්‍රමාණයක් වැය කර තාප්ප බැඳීමට වත්කමක් නැති නිසා ඔවුන්ගේ ගෙවතු ආරක්ෂාව සඳහා පහසුවෙන් හා ලාබයෙන් ඉදිකළ හැක්කේ පැළ ඉති වැටවල්ය.

පැළ ඉති වලින් වැට දමා ගැනීමෙන් ඉඩමේ ආරක්ෂාව පමණක් නොව පහත සඳහන් අතිරේක ප්‍රයෝජනයන්ද පහසුවෙන් ලබා ගැනීමට පිළිවන. ගෙවත්තේ පසට යෙදීමට වුවමනා කොළ පෝර ලබා ගැනීම සහ පහසුවට සත්වාහාර ප්‍රමාණයක් ළඟා කර ගැනීම ආදිය පැළ ඉති වැටෙන් ලබාගත හැකි වැඩි පුර ප්‍රයෝජන වෙති. එමෙන් වැටේ ජීවන කාලය වැඩි නිසා, එය හොඳින් තබා ගැනීමට නිතර අලුත්වැඩියා කිරීම වුවමනා වන්නේද නැත.

වැටට සිටුවීමට ග්ලිරිසීඩියා, එරබදු, නත්තසුරිය ආදිය හා වෙනත් පැළ වගී ගණනාවක් තෝරා ගැනීමට පිළිවන. පැළ ඉති වැට නිසියාකාර කප්පාදු කර තබා ගැනීමෙන් එහි ප්‍රයෝජනය වැඩිවන අතර හැඩහුරුකමද නෙත් ගන්නා සුළුව තබා ගැනීමට උපකාරි වේ.